WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021 (2022)

| | |
|---|---|
| පුරවැසි අධ්‍යාපනය | I, II |
| குடியியற் கல்வி | I, II |
| Civic Education | I, II |

# පුරවැසි අධ්‍යාපනය II

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. (i) ශ්‍රී ලංකාවේ ඡන්දදායකයන්ට ඡන්දය භාවිත කිරීමට අවස්ථාව සැලසෙන මැතිවරණ **දෙකක්** නම් කරන්න.
   (ii) මධ්‍යම ආණ්ඩුව සතු බලතල ප්‍රාදේශීය පාලන ආයතනවලට පැවරීමේ දී අනුගමනය කරන ක්‍රම **දෙක** මොනවා ද?
   (iii) ශ්‍රී ලංකාවට අතීතයේ දී වෙළඳාම සඳහා පැමිණි විදේශීය ජාතීන් **දෙකක්** නම් කරන්න.
   (iv) නිෂ්පාදන සාධක **දෙකක්** හා ඒ සඳහා කරන ගෙවීම් **දෙක** නම් කරන්න.
   (v) මානව සමාජය තුළ දක්නට ලැබෙන ගැටුම් වර්ග කළ හැකි ප්‍රධාන ක්ෂේත්‍ර **දෙක** කුමක් ද?
   (vi) නීතියේ ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.
   (vii) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවට නියෝජිතයන් තෝරාගන්නා ප්‍රධාන ක්‍රම **දෙක** නම් කරන්න.
   (viii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී අවධානයට යොමු වී ඇති ප්‍රධාන අංග **දෙකක්** නම් කරන්න.
   (ix) සංවර්ධනය වන රටවල් මුහුණපාන ප්‍රධාන ගැටලු **දෙකක්** සඳහන් කරන්න.
   (x) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ප්‍රධාන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 × 10 = 20 යි)

2. ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය සඳහා නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම අත්‍යවශ්‍ය සාධකයක් වේ.
   (i) ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි)
   (ii) නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   (iii) (*a*) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වය සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටු විය යුතු කාර්යයන් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)
   (*b*) ඉහත (*a*) හි සඳහන් **එක්** කාර්යයක් ඉටු කළ යුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

3. ගැටුම් ඇතිවීමට තිබෙන අවස්ථා අවම කරගැනීම ගැටුම් වළක්වා ගැනීමට හේතු වේ.
   (i) සූක්ෂ්ම ගැටුම්වලට නිදසුන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (ii) බේරුම්කරුවකු සතු විය යුතු ගුණාංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   (iii) (*a*) විනිසීමේ ක්‍රියාවලියේ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   (*b*) ඉහත (*a*) හි සඳහන් **එක්** ලක්ෂණයක් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**4.** ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් තුළ යුක්තිය හා නීතිය ආරක්ෂා කරදීම අධිකරණය සතු විශේෂ වගකීමක් වේ.

(i) නීතිපතිතුමාගේ කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීමට සහාය වන නිලධාරීන් **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(*b*) ඔබ සඳහන් කළ වැරදි වළක්වාලීම සඳහා පුරවැසියකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

**5.** පරිසර හිතකාමී තිරසර සංවර්ධනයක් රටකට අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වී ඇත.

(i) සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන නූතන මිනුම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ වර්තමාන සංවර්ධන අභියෝග ජයගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** යෝජනා කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) තිරසර සංවර්ධනය සඳහා ගමන් කිරීමේ දී පුරවැසියකු විසින් ඉටු කළ යුතු පුරවැසි යුතුකම් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් **එක්** යුතුකමක් ඉටු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

**6.** අර්ථ ක්‍රමයක් යනු මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගැනීම සඳහා යම් සමාජයක් සංවිධානය වී ඇති ආකාරය වේ.

(i) දැනට ලෝකයේ පවතින විවිධ අර්ථ ක්‍රම **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) ගෝලීයකරණය හා තාක්ෂණික දියුණුව නිසා ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන යහපත් ප්‍රතිඵල **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) වෙළඳපොළ අර්ථ ක්‍රමයක් තුළ දක්නට ලැබෙන අහිතකර ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් **එක්** අහිතකර ලක්ෂණයක් අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් යෝජනා කරන්න. (ලකුණු 02 යි)

**7.** ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට විවිධ ආගමික, සමාජයීය හා සංස්කෘතික සාධක බලපා ඇත.

(i) ශ්‍රී ලංකාවේ සිංහල ජාතියට අමතරව ජීවත්වන වෙනත් ජාතීන් වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බහුසංස්කෘතික සමාජයක පුරවැසියකු වශයෙන් ජීවත්වන ඔබ සමාජයේ යහපැවැත්ම සඳහා ප්‍රගුණ කරගත යුතු ගුණාංග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) බහුසංස්කෘතික සමාජයක එක්සත්ව ජීවත්වීමෙන් අත්වන ප්‍රතිඵල **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් **එක්** ප්‍රතිඵලයක් සමාජයේ යහපැවැත්මට හේතු වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

※ ※ ※

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....